# මාර්ගඵලලාභීන් අතින් සිදු වී ඇති වැරදි පිළිබඳ සූත්‍රාගත අධ්‍යයනයක්

පනාමුරේ චන්දිම හිමි[1]

## හැඳින්වීම

මිනිසත් බව ලබා උපන් සියලු දෙනාම මේ භවයේ දී ම නිවන් අවබෝධ කර ගැනීමට සමත් නොවේ. එහෙත් මේ භවයේ දීම සෝවාන් මාර්ගය හෝ ලැබිය හැකිය. ඒ සඳහා දොරටු විවර කර ගැනීම තමා විසින් ම කරගත යුතුය. බුදුන් දවස සිටි බොහෝ පිරිසක් බුදුන් වහන්සේ දැක ධර්මය ශ්‍රවණය කළ ද නිර්වාණය අවබෝධ කර නොගත්හ. නොයෙක් ආකාරයේ පස්පව් සිදුකළ අය ද පෙර පුණ්‍ය කර්මයන් මහිමයෙන් මාර්ගඵලලාභී වූ බව බුද්ධකාලීන නොයෙක් චරිත කතා අධ්‍යයනයෙන් අවබෝධ කරගත හැකිය. මෙහි දී සාකච්ඡා කිරීමට අපේක්ෂා කරන්නේ සෝවාන් ආදී මාර්ගඵලලාභීන් විසින් සිදු කරන ලද පාප ක්‍රියාවන් හෝ නරක පුරුදු පිළිබඳ ව අධ්‍යයනය කිරීමයි.

## අරමුණු

මාර්ගඵලලාභීන් ද විවිධ විෂම ක්‍රියාවන් හි යෙදී ඇති අතර එම වැරදිවල ස්වභාවය කුමක් ද? යන්න අධ්‍යයනය කිරීම ප්‍රධාන අරමුණ වේ. එසේ ම කුමන ඵලයන්ට පත් වූවන් වැරදි

1. තාවකාලික කථිකාචාර්ය, ශ්‍රී ලංකා භික්ෂු විශ්වවිද්‍යාලය, අනුරාධපුර.

හෝ නරක පුරුදු සිදු කරයි ද යන්න විමසීම මෙම අධ්‍යයනයෙහි අරමුණු වෙයි.

## ගැටලුව

මාර්ගඵලලාභීන් වැරදි සිදු කරයි ද? එම වැරදිවල ස්වභාවය කුමක් ද? එම වැරදි අපරාධ ලෙස නිර්වචනය කළ හැකිද? යන්න අධ්‍යයනය කිරීම මෙම පර්යේෂණයේ ප්‍රධාන ගැටලුව වෙයි.

## උපන්‍යාසය

සෝවාන් ආදී මාර්ගඵලවලට පත් අය තුළ නරක පුරුදු තිබිය හැකිය හෝ ඔවුන් වෙතින් යම් යම් වැරදි සිදුවිය හැකිය.

## ක්‍රමවේදය

සෝවාන් වූ පුද්ගලයන් වෙතින් සිදු වී ඇති විෂම ක්‍රියාවන් හෝ වැරදි ඇතුළත් සූත්‍ර කිහිපයක් පිළිබඳව මෙහිදී අධ්‍යයනය කිරීමට අපේක්ෂා කරමි.. සාහිත්‍ය ග්‍රන්ථ විමර්ශනය කිරීම මෙහි මූලික ව සිදු වෙයි. එසේම අටුවා ටීකා පරිහරණය තුළින් ද කරුණු ගවේෂණය කෙරිණ.

ඉහත ගැටලුවට අදාළ තොරතුරු ඇතුළත් සූත්‍ර කිහිපයක් මෙසේ දැක්විය හැකිය.

අංගුත්තර නිකායේ ඡක්ක නිපාතයේ දුතිය පණ්ණාසකයේ මහා වග්ගයේ චිත්ත හත්ථි සාරිපුත්ත සූත්‍රයේ සඳහන් වන ආකාරයට චිත්ත හත්ථි සාරිපුත්ත නම් භික්ෂුව කාමාශාව නිසා උපැවිදි වූ බව කියවේ. ඒ වන විට එම භික්ෂුව සෝවාන් මාර්ගයට පැමිණ සිටි බව ද කියවෙයි[1].

එසේ ම අංගුත්තර නිකායේ තික නිපාතයේ දුතිය පණ්ණාසකයේ සික්ඛාත්තය සූත්‍රය තුළින් ද පැහැදිලි වන්නේ සෝතාපන්න ඵලයට පත් වූ භික්ෂූන් වහන්සේ නමක් අතින් කුඩා විනය නීති උල්ලංඝණය විය හැකි බව ය[2].

මජ්ඣිම නිකායේ කෝසම්බිය සූත්‍රය අධ්‍යයනය කිරීමෙන් පැහැදිලි වන්නේ විනය නීති කඩ කරන ලද සෝවාන් ඵලයට පත් වූ භික්ෂූන් වහන්සේලා පිළිබඳ විස්තරයකි[3].

සංයුත්ත නිකායේ සෝතාපන්න සංයුත්තයේ සරකානි වග්ගයේ සරකානි සූත්‍රයේ සඳහන් වන ආකාරයට සරකානි නම් ශාක්‍යයා සෝවාන් ඵලයට පත් වූ අයෙකි. ඒ බව බුදුන් වහන්සේ ම දේශනා කොට ඇත. එහෙත් ඔහු දිනපතා උදේ හවස මත්වතුර පානය කළ අයෙක් බව සඳහන් වෙයි[4].

## සාකච්ඡාව

මේ අනුව පැහැදිලි වන්නේ සෝවාන් වූ පුද්ගලයෙකු යනු ඉතා ම සාමාන්‍ය අයෙකු බවයි. ඔහු වෙතින් පන්සිල් පද පහම වුව ද කඩ විය හැකිය. එහෙත් ඒ ගැන සිහිපත් වූ වහාම එම වැරදි නිවැරදි කර ගත යුතු බව අවබෝධ කරගනියි. නැවත නැවතත් එම වැරදි නොකරන්නට වීර්ය කරයි සෝවාන් ආදී මාර්ගවලට පත් නොවූ පුද්ගලයා කොතරම් වාරයක් පන්සිල් උල්ලංඝණය වුව ද එය නිවැරදි කර ගැනීමට උත්සාහ නොකරයි. සෝවාන් වූ පුද්ගලයා තුළ එක්තරා සීමාවක් යටතේ තරහ ගැනීම ව්‍යාපාදය, ඊර්ෂ්‍යාව, ලෝභ කම, අනුන් රැවටීම, කපටිකම, ලැජ්ජා භය නැති කම ආදිය ද තිබිය හැකිය.

සෝවාන් ඵලයට පත්විම යනු දස සංයෝජන ධර්ම තුනක් යටපත් වීමයි. එනම් සක්කායදිට්ඨි, විචිකිච්ඡා සීලබ්බත පරාමාස යන බන්ධනයන් තුන පමණක් සංසිඳවීම බව කියවෙයි.

සෝවාන් වූ පුද්ගලයා අතින් කිසිසේත් ම සිදුවිය නොහැකි අකුසල ධර්ම ලෙස දක්වා ඇත්තේ මව මැරීම, පියා මැරීම, බුදුන් වහන්සේගේ ශරීරයේ ලේ සෙලවීම, සංඝ භේදය සහ නිර්වාණය අවබෝධ කර ගැනීම සඳහා වෙනත් ශාස්තෘන් කෙනෙකු වෙත නොයෑම යි.

මේ අනුව සෝවාන් ආදී මාර්ග ඵලයන්ට පත්වීම ඉතාම අපහසු දුෂ්කර කාර්යයක් නොවන අතර තමා තුළ සක්කාය

දිට්ඨි, විචිකිච්ඡා සීලබ්බතපාරාමාස යන ලක්ෂණ කොතෙක් දුරට ඇතුළත් වී තිබේද යන්න අවබෝධකර ගැනීමෙන් තමා සෝවාන් මාර්ගයට පැමිණ තිබේ ද යන්න අවබෝධ කර ගත හැකිය.

## නිගමනය

සෝවාන් ඵලයට පත් වුව ද ඇතැම් අය වෙතින් යම් යම් ආකාරයේ වැරදි පුරුදු හෝ නරක ගති ඇති විය හැකි වේ.

ප්‍රමුඛ පද

සෝවාන්, මාර්ගඵල, වැරදි, සංයෝජන, පුරුදු, හොඳ, නරක

## ආශ්‍රිත ග්‍රන්ථ


1 අංගුත්තර නිකාය, ඡක්කනිපාතය, චිත්තහත්ථි සාරිපුත්ත සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 179 පිටුව.

2 අංගුත්තර නිකාය, තිකනිපාතය, සික්කාත්තය සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 232 පිටුව.

3 මජ්ඣිම නිකාය, කෝසම්බිය සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 415 පිටුව.

4 සංයුක්ත නිකාය, සෝතාපන්න සංයුත්තය, සාරසකානි සූත්‍රය, ත්‍රි.බු.ජ.මු. 173 පිටුව.